තේ පර්යේෂණ මණ්ඩලය - **2015**

තේ පර්යේෂණ මණ්ඩලයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1993 අංක 52 දරන තේ පර්යේෂණ මණ්ඩල පනතේ 15 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 -1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## **1.4** තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. **මූල්‍ය ප්‍රකාශන**
**-----------------**

2.1 **තත්ත්වාගණනය කළ මතය**
**-------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට තේ පර්යේෂණ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**2.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**--------------------------------------**

**2.2.1** **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**
**------------------------------------------**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 02
---------------------------------------------

සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය රු.341,321,000 ක මුදල මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ ක්‍රියාකාරකම් ලෙස දැක්විය යුතු වුවද මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂයේ අඩමාන ණය, දිරිදීමනා හා ක්‍රමක්ෂය ප්‍රතිපාදන එකතුව රු.7,214,280 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේ දී සැලකිල්ලට ගෙන නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07
------------------------------------------

(i) ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.49,983,824.03 ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) වත්කමක සාධාරණ වටිනාකම එහි ධාරණ අගයෙන් ප්‍රමාණාත්මක ලෙස වෙනස් වන විට වත්කම් ප්‍රත්‍යාගණනය කර සාධාරණ අගය ගිණුම්වල දැක්විය යුතු වුවත් මණ්ඩලය ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(iiii) ඉඩම් හා ගොඩනැගිලි එකිනෙකින් වෙන්කල හැකි වත්කම් වන අතර ඒවා වෙන් වෙන්ව වර්ගීකරණය කළයුතු වුවත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශයන්හි දැක්වෙන ශුද්ධ අගය රු. 202,749,711 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් එවැනි වර්ගීකරණයක් කර නොතිබුණි. ඒ අනුව ගොඩනැගිලි වෙනුවෙන් වූ ක්ෂය අගයෙහි නිවැරදිතාවය තහවුරුකර ගත නොහැකිවිය.

**2.2.2** **ගිණුම්කරණ ප්‍රතිපත්ති**
**------------------------**

යම් නිශ්චිත ගිණුම් කටයුත්තක් වෙනුවෙන් කටයුතු කළයුතු ආකාරය පිළිබඳව, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා භාවිතා කරන ලද ගිණුම්කරණ ක්‍රමයෙන් ආවරණය නොවන්නේ නම් එහිදී වඩාත්ම යෝග්‍ය ආකාරයට (මනා පරිචය) කටයුතු කළයුතු අතර, ඒ බව සඳහන් කර ගිණුම්කරණ ප්‍රතිපත්තියක් පිළියෙල කර එය අනුගමනය කළයුතු වුවත්, මණ්ඩලය විසින් පහත සඳහන් වත්කම් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට වූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දැක්වෙන වටිනාකම රු. 2,404,163 ක් වූ අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය කර ගිණුම්ගත කිරීම.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දැක්වෙන පිරිවැය රු.174,913,032 ක් වූ තේ වගාව මේරූ, නොමේරූ වශයෙන් වර්ග කර වෙන් වෙන්ව හඳුනා ගැනීම.

(ඇ) මණ්ඩලයට අයත් ඉඩම්වල වටිනාකමින් ඉහළ ශාඛ 5654 ක් හඳුනාගෙන ඇතත් වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීම.

### 2.2.3 ගණකාධිකරණ අඩුපාඩු

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කාර්ය මණ්ඩලය හා කම්කරුවන් වෙනුවෙන් අර්ථසාධක අරමුදල් දායකය ගණනය කිරීමේදී මූලික වැටුපට ජීවන වියදම් දීමනාව එකතුකර ඒ මත දායකය ගණනය කළයුතු වුවත් 2006 ජනවාරි සිට 2012 මැයි 30 දක්වා එසේ කටයුතු නොකිරීම නිසා 2015 දෙසැම්බර් 31 දිනට රු.36,986,901 ක් අරමුදලට ප්‍රේෂණය කළයුතු වුවත් ඒ සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) තේ කම්හල්වල වර්ෂයේ නොවිකිණූ නිමි තේ අවසන් තොගය ගිණුම්වලින් අනාවරණය කරනු වෙනුවට විකුණුම් ආදායම ගණනය කිරීමේදී ණයට විකුණුම් ලෙස සලකා ගිණුම්ගත කර තිබූ බැවින් වර්ෂයේ තේ විකුණුම් ආදායම හා ණයගැති ශේෂය රු. 2,884,584 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ තේ නිෂ්පාදිතයේ රොඩු තේ කිලෝග්‍රෑම් 12,592 ක් විකිණීම සඳහා ප්‍රසම්පාදන කටයුතු කර ගැණුම්කරුවන් වෙත ලබා දී තිබුණ ද එම විකුණුම් වටිනාකම වූ රු.273,667 ක් ලැබිය යුතු ආදායම් යටතේ ගිණුම් තබා නොතිබුණි.

### 2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

-------------------------------

ශාන්ත කුම්බස් කම්හලෙහි 2015 දෙසැම්බර් 31 දිනට නිමි තේ තොගයේ වටිනාකම රු.2,276,671 ක් වුවද ලෙජරයට අනුව එම ශේෂය රු.2,381,511 ක් වූ අතර රු.109,840 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම්

----------------------------------

පර්යේෂණ කටයුතු සඳහා මිලදී ගෙන ඒ ඒ පර්යේෂණ අංශයෙහි ගබඩාවල තැන්පත් කර තිබූ රසායනික ද්‍රව්‍ය තොග ශේෂයන් පිළිබඳ විස්තර ඇතුලත් ලේඛණ නඩත්තු කර නොතිබීම හේතුවෙන් එම තොග ශේෂයන්ගේ වටිනාකම තහවුරු කිරීමට ප්‍රමාණවත් තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය.

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

--------------------------------------------------------------------

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XV පරිච්ඡේදයේ 4.1 වගන්තිය | අධ්‍යාපන හෝ අභ්‍යාස සඳහා එක් මාසයකට වැඩි කාලයකට විදේශයන්ට යවනු ලබන රජයේ නිලධාරියකු දිවයිනෙන් බැහැරයාමට පෙර අවම සේවා කාල පරිඡේදයක් ආණ්ඩුවට සේවය කිරීමට බැඳීමේ ගිවිසුමකට අත්සන් කළ යුතු නමුත් නිළධාරීන්ගේ විදේශ ගමන් සම්බන්ධව ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 104 (2) | සමාලෝචිත වර්ෂය තුලදී ආයතනය සතු වාහන 5 ක් අවස්ථා 6කදී අනතුරු වලට භාජනය වී ඇතත් මුදල් රෙගුලාසි ප්‍රකාරව හානි හා පාඩු සම්බන්ධ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි |
| (ii) මුදල් රෙගුලාසි 177 (1) | දෛනිකව එකතුවන මුදල් එදිනම හෝ හැකි ඉක්මනින් බැංකු ගත කිරීම සිදු කළ යුතු නමුත් ශාන්ත කුම්බස් කර්මාන්තශාලාවේ අලෙවි සැලේ තේ අලෙවි ආදායම සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 316(2) | සුරක්ෂිත භාරයේ තැන්පත් කරනු ලබන හෝ එසේ තැබූ තැනකින් ඉවත්කරගනු ලබන හෝ ද්‍රව්‍ය පිළිබඳ වාර්තා වගකිවයුතු නිලධාරියකු විසින් පවත්වා ගතයුතු නමුත් ආයතනයේ සේප්පුවේ තැන්පත් කරනු ලබන මුදල් පිළිබඳ එවැනි ලේඛනයක් නඩත්තුකර නොතිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 317 හා 318 | සුරක්ෂිතාගාර පෙට්ටිවල යතුරු හා අනුයතුරු වගකිවයුතු නිළධාරියෙකු භාරයේ හා අධීක්ෂණය යටතේ පැවතිය යුතු නමුත් ඊට පටහැනිව ආයතනයේ සේප්පුවේ යතුරු මුදල් අයකැමි භාරයේ පැවතුණි. |
| (v) මුදල් රෙගුලාසි 341 | කුවිතාන්සි පොත් සම්බන්ධව ජී.ඒ.ඇන් 20 ප්‍රකාරව ලේඛණයක් නඩත්තු කල යුතු නමුත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (vi) මුදල් රෙගුලාසි 397 | චෙක්පත් මගින් කෙරෙන සියලුම ගෙවීම් සඳහා තම බැංකු ශේෂය ප්‍රමාණවත් දැයි ගෙවීම් කරන නිලධාරියා විසින් නිතරම සොයා බැලියයුතු වුවත් එසේ නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට මණ්ඩලයේ ලංකා බැංකුවේ |

| | | |
|---|---|---|
| | | කෝපරේට් ශාඛාවේ අංක 1571 දරන බැංකු ගිණුමට අදාල රු.1,602,383 අයිරා ශේෂයක් විය. |
| (ඈ) | 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | එක් අවස්ථාවකදී රු.100,000 කට නොවැඩි ලෙස අත්තිකාරම් මුදල් ලබාදිය යුතු වුවත් ඊට පටහැනිව ආයතනය විසින් රු.101,880 සිට රු.1,100,000 දක්වා අත්තිකාරම් මුදල් අවස්ථා 13 කදී ලබාදී තිබුණි. |
| (ඇ) | 1978 දෙසැම්බර් 12 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | විධිමත් පරිදි ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණු අතර මණ්ඩලයට අයත් ඉඩම් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

--------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.13,302,192 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.36,251,018 ක් වුයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.22,948,826 ක වර්ධනයක් නිරීක්ෂණය විය. පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.41,595,000 ක් වැඩියෙන් ලැබී තිබීම සහ ශාන්ත කුම්බස් වතුයාය හා කම්හලෙහි ශුද්ධ ලාභය රු. 2,885,648 කින් එනම් සියයට 60 කින් වැඩිවීමත් ඉහත වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අඛණ්ඩ මූල්‍ය ඌනතාවයක් ඇතිවී තිබුණි. කෙසේ වුවද සේවක පාරිශ්‍රමික, රාජ්‍ය බදු හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය සැලකිල්ලට ගැනීමේදී මණ්ඩලයේ දායකත්වය 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම ධන අගයක් ගෙන තිබූ අතර 2011 වර්ෂයේදී රු.මිලියන 58.53, ක් වූ දායකත්වය 2013 වන විට රු.මිලියන 53.14 ක් දක්වා සුළු වශයෙන් අඩු වී තිබුණු නමුත් 2014 වර්ෂයේ සිට එය ක්‍රමයෙන් වර්ධනය වී සමාලෝචිත වර්ෂය අවසානයට රු.මිලියන 157.1 ක් වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

-----------------------------------

මණ්ඩලයට අයත් ශාන්ත ජෝකීම් වතුයායෙහි මෙහෙයුම් ලාභ අනුපාතය සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ සෘණ අගයක් ගෙන තිබූ අතර එය පිළිවෙලින් සියයට 19.03 ක් හා සියයට 7.16 ක් විය. වතුයායේ තේ ඵලදාව අඩුවී තිබීම හා නිමි තේ විකුණුම් ආදායම සියයට 46 කින් පිරිහී තිබීම මෙහෙයුම් අලාභය වර්ධනය සඳහා සෘජුවම බලපා තිබුණි.

### 3.3 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

--------------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශාන්ත ජෝකීම් වතුයායට අයත් හෙක්ටයාර් 05 ක් පමණ වූ ඉඩම් වසර 25 කට අධික කාලයක සිට බාහිර පාර්ශවයන් විසින් බලෙන් අල්ලාගෙන තිබූ අතර ආයතනය විසින් එම ඉඩම් අත්පත් කරගැනීම සඳහා අධිකරණයේ නඩුවක් ගොනුකර තිබුණි.

(ආ) සම්පූර්ණ වැටුප් සහිත විදේශ අධ්‍යයන නිවාඩු ලබා පිටරට ගොස් නැවත දිවයිනට නොපැමිණි නිලධාරීන් 06 දෙනෙකු මණ්ඩලය සමඟ එළඹ තිබූ ගිවිසුම් ප්‍රකාරව කටයුතු නොකිරීම හේතුවෙන් රු.18,552,991 ක් වූ බැඳුම්කර මුදල් අයකර ගැනීම සඳහා අධිකරණවල වසර 5 කට පෙර සිට නඩු පවරා තිබුණි.

(ඇ) බාහිර පාර්ශවයක් විසින් ආයතනය තෙවන විත්තිකරු ලෙස සඳහන් කරමින් ඉඩම් කොටසක් අත්පත් කරගැනීම සඳහා නඩුවක් ගොනුකර තිබුණි.

(ඈ) ආයතනයේ සේවකයකු විසින් කලින් දැරූ තනතුරට නැවත සේවය ලබා ගැනීම සඳහා ආයතනයට එරෙහිව කම්කරු උසාවියේ නඩුවක් ගොනුකර තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 4.1 කාර්යසාධනය

---------------

1993 අංක 52 දරන තේ පර්යේෂණ මණ්ඩල පනතේ 5 වන උප වගන්තිය හා 2003 අංක 30 දරන සංශෝධිත පනත අනුව තේ පර්යේෂණ මණ්ඩලයේ අරමුණු පහත පරිදි වේ.

(i) තේ වගාවේ රෝග සහ පළිබෝධ වැලැක්වීම සහ මර්ධනය නිමි තේ වල ගුණත්වය ඉහළ නැංවීම, නිෂ්පාදන විවිධාංගීකරණ ආදී තේ වගාව සහ නිෂ්පාදනය සඳහා බලපාන සියළු ගැටළු සහ කරුණු පිළිබඳව පර්යේෂණ මෙහෙයවීම , සහයෝගය ලබා දීම සහ දිරිමත් කිරීම.

(ii) ශ්‍රී ලංකා තේ කර්මාන්තයේ අනාගත ආර්ථික ප්‍රවනතා ද ඇතුලුව එම කර්මාන්තයේ ආර්ථික ස්වශක්‍යතාව පිළිබඳව පර්යේෂණ පැවැත්වීම. එහි ලා සහය වීම සහ ඊට අනුබල දීම

(iii) තලවාකැලේ පිහිටි තේ පර්යේෂණ ආයතන හා එහි උප ආයතන මණ්ඩලයේ රීතිවලට අනුකූලව පවත්වාගෙන යාම හා පරිපාලනය කිරීම.

(iv) ශ්‍රී ලංකාවේ සහ විදේශවල පිහිටි පර්යේෂණ ආයතන සමඟ සම්බන්ධතා ඇතිකර ගැනීම පවත්වාගෙන යාම .

(v) ස්වශක්ති කර්තව්‍ය ඉටු කිරීමේ දී, විදේශීය පර්යේෂණ ආයතන සහ ශ්‍රී ලංකාවේ පර්යේෂණ ආයතන සමඟ ඒකාබද්ධ අධ්‍යයන වැඩ පිළිවෙලවල් , සාකච්ඡා හා සම්මන්ත්‍රණ පැවැත්වීම.

(vi) තේ පර්යේෂණ සඳහා ආයෝජන ප්‍රවර්ධනය කිරීම.

(vii) තේ කර්මාන්තය පිළිබඳ දත්ත රැස් කිරීම සහ ඒවා බෙදා හැරීමට බාර ගැනීම සහ තේ කර්මාන්තයෙහි සංවර්ධන ශක්‍යතාව දැනගැනීම සඳහා පර්යේෂණ පැවැත්වීම.

(viii) තේ කර්මාන්තයට අදාල උචිත ප්‍රතිපත්ති පිළිබඳව අමාත්‍යවරයාට උපදෙස් දීම සහ වෙනත් නියෝජ්‍යායතන සමඟ සම්බන්ධීකරණය කිරීම.

උක්ත අරමුණු ඉටුකර ගැනීමේදී මණ්ඩලය ක්‍රියාත්මක කරන ලද පර්යේෂණ සහ අනෙකුත් කාර්යයන් සම්බන්ධයෙන් කාර්ය සාධන ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ.

(අ) මණ්ඩලයේ පර්යේෂණ ව්‍යාපෘති වැඩි ප්‍රමාණයක් කෙරීගෙන යන දීර්ඝ කාලීන ව්‍යාපෘති වන අතර භාණ්ඩාගාරයෙන් වාර්ෂිකව ලද පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා වූ ප්‍රදානයන්ගෙන් රු.6,718,075 ක් වැය කරමින් අරඹන ලද ව්‍යාපෘති 08 ක් අපේක්ෂිත අරමුණු කරා ලඟා නොවී අතරමග නවතා දමා තිබූ බව නියදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ආ) පර්යේෂණ උපදේශන කමිටුවේ නිර්දේශ මත අඩු බලපෑම් සහිත ව්‍යාපෘතියක් ලෙස සලකා ශෂ්‍ය විද්‍යා අංශයේ A10.4 ව්‍යාපෘතිය 2012 වර්ෂයේ දී නවතා දැමූ බව විගණනයට ඉදිරිපත් කරන ලද පර්යේෂණ අංශ වාර්තාවන්හි සඳහන් වුවද ඉන් අනතුරුව ඒ සඳහා රු.2,514,611 ක මුදලක් වැයකර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව රු. මිලියන 3.93 ක වියදම් දරා ආරම්භ කිරීමට සැලසුම් කල ව්‍යාපෘති 03 ක් වර්ෂය තුලදී ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ ප්‍රගති වාර්තා අනුව පහත පර්යේෂණ ව්‍යාපෘති වල මූල්‍ය කාර්ය සාධනය සියයට පනහකට වඩා අඩු මට්ටමක පැවතුණි.

| ව්‍යාපෘති කාණ්ඩය | ඇස්තමේන්තුගත පිරිවැය | තථ්‍ය පිරිවැය | වැය කළ ප්‍රතිශතය |
|---|---|---|---|
| | රු. | රු. | % |
| A1.3 | 2,223,774 | 277,109 | 12.5 |
| A30.5 | 2,807,140 | 499,097 | 17.8 |
| A50.4 | 2,848,029 | 1,115,957 | 39.2 |
| A50.6 | 1,292,045 | 509,271 | 39.4 |
| A15.1 | 3,835,045 | 1,833,290 | 48 |

(ඉ) වෙනත් විශේෂ ව්‍යාපෘති යටතේ තේ වගාවේ ක්ෂේත්‍ර කටයුතු යාන්ත්‍රීකරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා කුඩා තේ වතු හිමියන්ට බෙදා දී තිබූ යන්ත්‍රෝපකරණ භාවිතය ක්ෂේත්‍රය තුල අවම මට්ටමක පවතින බැවින් ව්‍යාපෘතියේ අරමුණු ඵලදායී ලෙස ඉටු වී නොමැති බව නියදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ඊ) මණ්ඩලය විසින් හඳුන්වාදෙන ලද ක්‍රමවේදයන් සම්බන්ධව තාක්ෂණය පැවරීම සඳහා බාහිර ආයතන සමඟ ගිවිසුම් අත්සන් කර තිබූ නමුත් 2015 වර්ෂයේ කිසිදු පුරස්කාර ආදායමක් ලැබී නොතිබුණි.

(උ) මණ්ඩලය විසින් කළමනාකරණය කරනු ලබන ශාන්ත කුම්බ්ස් සහ ශාන්ත ජෝකීම් යන වතුයායන් දෙකෙහි සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම හා එහි කාර්යසාධනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කෙරේ.

(i) ශාන්ත කුම්බ්ස් හා ශාන්ත ජෝකීම් වතුයායන් දෙකෙහි ක්‍රියාකාරී සැලැස්ම අනුව අමු තේ දළු මිලදී ගැනීම පිළිවෙලින් කිලෝග්‍රෑම් 528,000 ක් 1,915,347 ක් වූ අතර තථ්‍ය මිලදී ගැනීම පිළිවෙලින් කිලෝග්‍රෑම් 437,318 ක් හා 955,206 ක් වුයෙන් විචලනය සියයට 17.17 ක් හා සියයට 50.13 ක් විය.

(ii) ක්‍රියාකාරී සැලැස්ම අනුව ශාන්ත ජෝකීම් වතුයායෙහි හෙක්ටයාරකට ඉපයීම කිලෝග්‍රෑම් 923 ක් වුවද කාර්යසාධන වාර්තාවට අනුව එය කිලෝග්‍රෑම් 619 ක් විය.

(iii) ශාන්ත කුම්බ්ස් වතුයායෙහි ක්‍රියාකාරී සැලැස්මට අනුව අපේක්ෂිත කසල තේ ප්‍රතිශතය සියයට 8 ක් වූ අතර තථ්‍ය ප්‍රමාණය සියයට 10.09 ක් විය.

(iv) එක් එක් කම්හලේ තේ විකුණුම් ප්‍රමාණයන් හා නිෂ්පාදන පිරිවැය ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී පහත පරිදි විය.

| **විස්තරය** | **ශාන්ත ජෝකිම් වතුයාය** | | **ශාන්ත කුම්බ්ස් වතුයාය (ලැමිලියර් කොටසද ඇතුළුව)** | |
|---|---|---|---|---|
| | **2015** | **2014** | **2015** | **2014** |
| තේ විකුණුම් (කිලෝග්‍රෑම්) | 203,273 | 346,446 | 393,378 | 369,706 |
| නිෂ්පාදන පිරිවැය (කිලෝග්‍රෑමයකට රු.) | 436.15 | 457.61 | 481.10 | 500.04 |
| ශුද්ධ විකුණුම් සාමාන්‍යය මිල (කිලෝග්‍රෑමයකට රු.) | 393.09 | 432.85 | 475.93 | 493.97 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ඉකුත් වර්ෂය හා සැසඳීමේදී ශාන්ත ජෝකිම් වතුයායේ විකුණුම් ප්‍රමාණය කිලෝග්‍රෑම් 143,233 කින් අඩුවී තිබුණු අතර තේ කිලෝවක නිෂ්පාදන පිරිවැය සියයට 5 කින් අඩුවී පැවතියද ඊට සාපේක්ෂව ශුද්ධ විකුණුම් සාමාන්‍ය මිල සියයට 9 කින් අඩුවී තිබුණි.

(ii) ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ ශාන්ත කුම්බ්ස් වතුයායේ විකුණුම් ප්‍රමාණය කිලෝග්‍රෑම් 23,672 කින් වැඩිවී තිබුණද තේ කිලෝවක ශුද්ධ විකුණුම් සාමාන්‍ය මිලට වඩා වැඩි වටිනාකමක් පිරිවැය ලෙස දරා තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පර්යේෂණ කටයුතු සඳහා මිලදීගෙන තිබූ රසායනික ද්‍රව්‍ය මධ්‍යගත ගබඩාවක රැස්කර අවශ්‍ය ප්‍රමාණයන්ගෙන් නිකුත් කිරීමේ පිළිවෙතක් අනුගමනය නොකර එක් එක් පර්යේෂණ අංශවල ගබඩා කර තිබීම හේතුවෙන් එකම වර්ගයේ රසායනික ද්‍රව්‍ය විවිධ ප්‍රමාණයන්ගෙන් ස්ථාන කිහිපයක ගබඩා කර තිබීමත්, ඇතැම් රසායනික ද්‍රව්‍ය කල් ඉකුත් වීමටත් සහ අනවශ්‍ය තොග පැවතීමත් සිදුවී තිබුණි.

(ආ) මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලීය පුස්තකාලයේ පොත් 1978 වර්ෂයේ සිට භෞතික පරීක්ෂාවක් සිදු කර නොතිබුණු අතර පසුගිය වසර 20 ක කාලය තුල (1985 – 2016) බැහැර ගෙන යනු ලැබූ පොත් වලින් ආපසු භාර නොදුන් සංඛ්‍යාව 186 ක් වූ අතර ඒවා නැවත ගෙන්වා ගැනීමට හෝ වටිනාකම පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ආයතනයේ භාවිතයේ පවතින වාහන 5 ක අයිතිය මණ්ඩලයට පවරා ගැනීමට 2016 අගෝස්තු 31 දින දක්වාම කටයුතු කර නොතිබුණි.

**4.3 අරමුදල් ඌන උපයෝජනය**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 හා 2014 වර්ෂවලදී පිළිවෙලින් ජීවන මට්ටම ඉහල නැංවීමේ ව්‍යාපෘතිය සහ යාන්ත්‍රීකරණ ව්‍යාපෘතිය යන විශේෂ ව්‍යාපෘතීන් සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු පිළිවෙලින් රු. 5,699,717ක් හා රු. 3,300,989 ක් සමාලෝචිත වර්ෂයේ ද වැයකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වියදම් දැරීම සඳහා ලැබී තිබුණු රු. 2,971,000 ක් වැය නොකර ඉදිරි වර්ෂය සඳහා ගෙන ගොස් තිබුණි.

**4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශාන්ත කුම්බස් වතු වෛද්‍ය සහායක භාරයේ පැවති රු. 210,408 ක් වටිනා බෙහෙත් ද්‍රව්‍ය තොගය වර්ෂ 03 ක සිට භාවිතයට නොගෙන නිෂ්ක්‍රීයව පැවතුණි.

(ආ) මණ්ඩලය සතු නිල නිවාස අතරින් ඒ කාණ්ඩයේ නිල නිවාසයක් ද සී කාණ්ඩයේ නිල නිවාස 4 ක් හා ඩී කාණ්ඩයේ නිල නිවාස 19 ක් භාවිතා නොකර නිෂ්කාර්යව පැවතුණි.

(ඇ) ශාන්ත කුම්බස් වතුයායේ හා ශාන්ත ජෝකිම් වතුයායේ යන්ත්‍ර ධාරිතාවය පිළිවෙලින් අමු තේ දළු දිනකට කිලෝ ග්‍රෑම් 8,000 ක් හා කිලෝ ග්‍රෑම් 15,810 ක් විය. කෙසේ වුවද එම යන්ත්‍රවල තථ්‍ය සාමාන්‍ය උපයෝජනය පිළිවෙලින් දිනකට කිලෝග්‍රෑම් 5,000 (සියයට 62) ක් සහ කිලෝ ග්‍රෑම් 6253 (සියයට 17) ක් බව නිරීක්ෂණය විය.

(ඈ) ශාන්ත කුම්බස් කම්හලේ E.C.P.4 Drier යන්ත්‍රය වසර 15 ක සිට භාවිතයෙන් තොරව පැවතුණි.

(ඉ) කර්මාන්තශාලාව ආරම්භයේදී සවිකර තිබෙන රෝල යන්ත්‍ර 04 කින් නිෂ්පාදන ක්‍රියාකාරීත්වය සඳහා වරකට භාවිතයට ගනු ලබන්නේ යන්ත්‍ර 02 ක් පමණක් වන අතර අනෙක් යන්ත්‍ර 02 ක ඌන උපයෝජිතව පැවතුණි.

(ඊ) ශාන්ත ජෝකිම් වතුයායට අයත් ඉඩම්වල වී,තේ, රබර්, පොල් හා වෙනත් භෝග වගාකර තිබුණද හෙක්ටයාර් 8.74 ක් වූ කුඹුරු වලින් ලැබෙන ආදායම ආයතනයට ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. තවද රබර් හා පොල් වතුවල ඇති ගස් ප්‍රමාණය ගණනය කර ලේඛනගත කිරීමටද කටයුතු කර නොතිබුණි.

(උ) ආයතනය සතු අත්ට්‍රැක්ටර් 5ක් ධාවන තත්වයේ නොපවතින බව හඳුනාගෙන තිබුණද ඉවත්කිරීමට කටයුතු කර නොතිබූ අතර ධාවන තත්වයේ පවතින මෝටර් රථයක් අළුත්වැඩියා කිරීමෙන් තොරව වර්ෂ 5 ක කාලයක සිට නිෂ්ක්‍රීයව පැවතුණි.

**4.5 ප්‍රමාද වූ ව්‍යාපෘති**

-----------------

මණ්ඩලයේ ජල සම්පාදන පද්ධතියේ වැඩිදියුණු කිරීමේ කාර්යය සඳහා වූ කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව ව්‍යාපෘතිය 2015 ජනවාරි 31 දින වන විට නිම කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු නොකිරීම හේතුවෙන් 2015 සැප්තැම්බර් 09 දින දක්වා කාලය දීර්ඝ කර තිබුණද 2016 අගෝස්තු 25 දින වන විටත් අදාල කාර්යය නිමකර නොතිබුණි.

**4.6 කාර්ය මණ්ඩල පරිපාලනය**

2015 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාව 443 ක් වූ අතර තථ්‍ය සංඛ්‍යාව 241 ක් විය. ඒ අනුව තනතුරු 202 ක් පුරප්පාඩු වී පැවති අතර තනතුරු 91 ක අතිරික්තයක් විය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විධායක නොවන මට්ටමේ තනතුරු 107 ක් පුරප්පාඩුව පවතින අතර ඊට ඇතුළත් පර්යේෂණ හා සංවර්ධන තාක්ෂණ නිලධාරීන්ගේ සහ ව්‍යාප්ති නිලධාරීන්ගේ අනුමත තනතුරු සංඛ්‍යාව පිළිවෙලින් 50 ක් හා 24ක් වූ අතර ඉන් තනතුරු 43 ක් සහ 14 ක් එනම් සියයට 77 ක් පුරප්පාඩුව පවතින බැවින් මණ්ඩලයේ පර්යේෂණ හා ව්‍යාප්ති කටයුතු සැලසුම් අනුව ඉලක්කගත කාලය තුල ඉටුනොවන බව විගණනයේදී නිරීක්ෂණය වේ.

(ආ) නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) තනතුර 2012 වර්ෂයේ සිට පුරප්පාඩුව පවතින අතර පුවත්පත් දැන්වීම පලකර අයදුම්පත් කැඳවා තිබුණද බඳවාගැනීම් පටිපාටිය අනුව සුදුසුකම් සපුරා නොතිබීම හේතුවෙන් 2016 අගෝස්තු 31 දින වන විටත් තනතුර පුරප්පාඩුව පැවතුණි.

(ඇ) 2014 නොවැම්බර් 12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014 පරිදි තාවකාලික හෝ අනියම් පදනම මත බඳවා ගෙන ඒ වන විටත් සේවයේ යෙදී සිටි සේවකයින් 112 දෙනෙකුට (ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරු 105 ක් හා කළමනාකරණ සහකාර තනතුරු 07ක් ) 2014 ඔක්තෝබර් 24 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්වීම් ලබා දී තිබුණි. කෙසේවුවද 2015 දෙසැම්බර් 31 දිනට පී එල්-1 යටතේ අනුමත සාමාන්‍ය කම්කරු තනතුරු ගණන 65 ක් වුවත් මෙම බඳවා ගැනීම් හේතුවෙන් එම කාර්ය මණ්ඩලයේ 91 දෙනෙකුගේ අතිරික්තයක් විය.

**4.7 දෘශ්‍ය අක්‍රමිකතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සියලුම තේ නිෂ්පාදිත බ්‍රෝකර් සමාගම හරහා තේ වෙන්දේසියට ඉදිරිපත් කර අලෙවිකල යුතු නමුත් සමාලෝචිත වර්ෂයේදී බ්‍රෝකර් සමාගම නමින් නිකුත් කරන ලද ඉන්වොයිස් පත් දෙකකට අදාල තේ කිලෝග්‍රෑම් 224 ක් ඊට පටහැනිව කම්හල් කළමනාකරණය මගින් අවභාවිතයට ලක්කර තිබුණි.

(ආ) බාහිර ආයතනයක් වෙත අත්තිකාරම් මුදල නිදහස් කිරීමට පූර්වයෙන් අදාල කාර්යය ඉටුකිරීමට ශක්‍යතාවයක් පවතීද යන්න සනාථ කරගත යුතු වුවත් ඒ පිළිබඳ සැලකිලිමත් නොවී 2011 වර්ෂයේදී මතුගම ප්‍රාදේශීය කාර්යාලය සඳහා ජල ආශ්‍රිත ඒකකයක් මිලදී ගැනීම සඳහා රු.110,124 ක් අත්තිකාරම් ලෙස පෞද්ගලික ආයතනයකට ගෙවා තිබුණද එම ආයතනය වසා දමා ඇති බවට හඳුනාගෙන ඇතත් එම වටිනාකම පියවා ගෙන නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**5.1 ගිණුම් ඉදිරිපත් කිරීම**

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 6.5.1 ඡේදය පරිදි මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණනයට ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කරන ලද්දේ 2016 ජූලි 01 දිනදීය. තවද කෙටුම්පත් වාර්ෂික වාර්තාව 2016 ඔක්තෝබර් 30 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 5.2 අභ්‍යන්තර විගණනය

---------------------

අභ්‍යන්තර විගණන අංශයක් ආයතනය තුල ස්ථාපිත කර තිබුණද මණ්ඩලයේ ප්‍රධාන කාර්යය වන පර්යේෂණ කටයුතු සම්බන්ධව මුල්‍ය හෝ භෞතික කාර්යසාධනය සම්බන්ධව කිසිඳු පරීක්ෂාවක් සිදු කර නොතිබුණි.

## 5.3 අයවැය ලේඛනමය පාලනය

------------------------------

අයවැයගත ආදායම් හා වියදම් හා තථ්‍ය සංඛ්‍යා අතර සියයට 35 සිට සියයට 100 දක්වා සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 5.4 නොවිසඳී ඇති විගනණ ඡේද

-------------------------------

(අ) අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ හා ප්‍රාදේශීය කාර්යාලවල ස්ථාන භාර නිලධාරීන්ගේ නිල නිවාස නඩත්තු කිරීම සඳහා මාසික කම්කරු දීමනාවක් ප්‍රතිපූරණය කීරීමට 2007 මැයි 24 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබුණි. මෙම කම්කරු දීමනාව දෛනික කම්කරු වැටුපට නිෂ්පාදන ප්‍රසාද දීමනා, අතිකාල, පැමිණීමේ දීමනා යනාදිය එකතු කර ගණනය කර තිබුණු අතර 2015 වර්ෂයේදී නිලධාරීන් 13 දෙනෙකු සඳහා රු.2,540,470 ක් මණ්ඩලය විසින් ප්‍රතිපූරණය කර තිබුණි. අදාල රේඛීය අමාත්‍යාංශයේ හා භාණ්ඩාගාරයේ මේ සඳහා අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර 2014 නොවැම්බර් 19 දිනැති රාජ්‍ය ව්‍යාපාර කාරක සභා රැස්වීමේදී ලබා දෙන ලද උපදෙස් පරිදි 2016 ජුනි 30 දක්වාම කටයුතුකර නොතිබුණි.

(ආ) මණ්ඩලය විසින් ඒ ඒ විෂයයන්ට අදාල චක්‍රලේඛ නියමයන් හා අනෙකුත් සමාන ආයතන අභිබවා කාර්ය මණ්ඩලය වෙත ලබා දෙනු ලබන නිවාඩු, නිල නිවාස හා පරිභෝජනය කරනු ලබන ජලය, විදුලිය වෙනුවෙන් ගාස්තු අය නොකිරීම වැනි වරප්‍රසාද සම්බන්ධයෙන් භාණ්ඩාගාර අනුමැතීන් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) තේ සැකසුම් කිරීම සඳහා ආයතනය විසින් 1982 වර්ෂයේදී රු.4,142,173 ක් වැය කර ආනයනය කරන ලද යන්ත්‍ර අදාල ව්‍යාපෘතිය සඳහා යෝග්‍ය නොවූ බැවින් නිෂ්කාර්යව පැවතුණි. මෙම වටිනාකම භාණ්ඩාගාර අනුමැතිය මත පොත්වලින් කපාහැරීමට කටයුතු කරන බව දන්වා තිබුණද මේ දක්වා ගිණුම්වලින් ඉවත් කර නොතිබුණු අතර කෙරීගෙනයන වැඩ ලෙස තවදුරටත් දක්වා තිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) වත්කම් පාලනය | සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම් ප්‍රත්‍යාගණනය කර නොතිබීම. |
| (ආ) කර්මාන්තශාලා මෙහෙයුම් පාලනය | ශාන්ත ජෝකිම් කම්හලේ නිෂ්පාදනය පහත වැටීම හා අඛණ්ඩව පාඩු ලබා තිබීම. |

| | | |
|---|---|---|
| (ඇ) | අයවැය පාලනය | අයවැයගත හා තථ්‍ය වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වීම. |
| (ඈ) | ගිණුම්කරණය | නියමිත දිනට ගිණුම් ඉදිරිපත් කර නොතිබීම. |